98)

'කොළඹ දකුණ අධ්‍යාපන දිස්ත්‍රික්කයේ

(දෙහිවල මණ්ඩලය ඇසුරින්) පාසැල්වල

ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය සඳහා රජය

දරණ ඒක පුද්ගල පිරිවැය'.

මෙම පර්යේෂණ කෘතිය 1982 දර්ශනපති

පශ්චාත් උපාධිය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ

අධ්‍යාපන පීඨයට ඉදිරිපත් කෙරේ.

ඩබ්.එම්. ද සිල්වා.

UCLIB
388302

## සාරාංශය

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය විමර්ශණයට ලක්කිරීමේදී පෙනී යන වැදගත් අංගයක් වනුයේ සම අවස්ථා සැපයීමට ගෙන ඇති ප්‍රයත්නයන්ය. අධ්‍යාපන ඉතිහාසය විග්‍රහ කිරීමෙන් සම අවස්ථා සැපයීමට ක්‍රමයෙන් වැදගත් පියවර රාශියක් ගෙන ඇති බව පෙනී යයි. නිදහස් අධ්‍යාපනය බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය දක්වා සැපයීම, පාසැල් රජයට පවරා ගැනීම, ගමනා ගමන සහනාධාර සිසුනට සැපයීම, සහ නූතන රජය මගින් පෙල පොත් පවා බෙදා හැරීම සම අවස්ථා සැපයීම වස් ගෙන ඇති මහගු පියවර කීපයකි.

අධ්‍යාපනයේ සෙපෝටනයක් ඇති මෙම අවධියේ රජය ඒ සඳහා දරණ පිරිවැය ප්‍රමාණය අති මහත්ය. මෙම පිරිවැය සාධාරණව පාසැල් අතර, සිසුන් අතර විවිධ අධ්‍යාපන අවස්ථා අතර බෙදී යන්නේද යන්න විග්‍රහයට ලක්විය යුතු වැදගත් අංගයක්ව පැවතේ. පිරිවැය අංශයෙන් සම අවස්ථා සංකල්පය කොපමණ දුරට ඉටුවනවාදැයි විමසා බැලීමට ගත් ප්‍රයත්නයේ ප්‍රතිඵලයකි මෙම සමීක්ෂණය. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපන අවස්ථාව සමීක්ෂණය මගින් විමර්ශණයට ලක්වේ. පාසැල් අතර, විෂයධාරා අතර සහ විවිධ විෂයයන් අතර පිරිවැය සමානව බෙදී යනුයේද යන්නද විමසිල්ලට ලක්කර ඇත. දෙහිවල මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය ලබා දෙන සියලුම පාසැල් මෙහිදී විග්‍රහයට ලක්කර ඇත. එමගින් ගුරු වැටුප්, පරිපාලන වැටුප්, සුභසාධක වැය, ක්‍රීඩා හා ගුරු වැටුප් නොවන අංශද ගමනා ගමනය සඳහා දරණ සහනාධාර ගැනද විමර්ශනයට ලක්කර ගණනය කර ඇත. ද්විතීයික අංශයේ විෂයයන් අතර, විෂය ධාරා අතර හා එකම විෂය ඇති පාසල් අතර පවා රජයේ පිරිවැය බෙදීයාම පිළිබඳ කරනු ලැබූ සුවිශේෂ විග්‍රහයකි. එමගින් මේ සියලු අංශයන්හි පිරිවැය බෙදීයාමේ විෂමතාවයන් ඇති බව සඵුට විය.

නියැදිය කුඩා වීම, එය නගර බද පාසල්වලට පමණක් සීමාවීම, පුණරාවර්තන රජයේ පිරිවැය අංශ පමණක් විග්‍රහයට ලක්වීම පෞද්ගලික අංශයේ පිරිවැය සැලකිල්ලට නොගැනීම මෙහි ඇති අඩුපාඩු කීපයකි. එහෙත් අනාගත සමීක්ෂණයන්ට හා සැලසුම් කරණයට වැදගත් තොරතුරු රැසක් අනාවරණය වීණ. ශිෂ්‍ය ගුරු අනුපාතයේ වෙනස, සැලසුම් රහිතව විෂයධාරා පාසල්වල පවත්වා ගෙනයාම සහ පිරිවැය අපතේ යාම සිදුවන බවද පෙනී යයි.

පෞද්ගලික අංශයේ පිරිවැය ගණනය කිරීම, ගම්බද හා නාගරික වෙනස්කම් ඇත්දැයි සොයා බැලීම හා රජයේ ප්‍රාග්ධන වැය පාර්ෂවය ගණනය කිරීමද අනාගත සමීක්ෂණයට එල්ල කල හැකි අංශයන් බව යෝජිතය. සැලසුම්කරණයටත් අපතේ යාම වලක්වා ලීමටත් ඒක ශීර්ෂ ආදායම ගණනය කිරීම ඉතාම වැදගත් බවත් කාලෝචිත බවත් මෙයින් නිගමනය කෙරේ.